# නර්තනය - 6 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

<u>**නැළවිලි**</u>

<u>**කවි**</u>






- **දෙමව්පියන් නිවසේදී තම දරුවන් නැළවීමට මෙම කවි ගායනා කරයි.**
- **සෑම ජන කොට්ඨාසයකටම පොදු වූවකි.**
- **ලයාන්විත නාද මාලාවකින් ගායනා කරයි.**
- **මව්පිය සෙනෙහස හා දරු සෙනෙහස පෙන්වන කවි විශේෂයකි.**
- **සරල බස් වහරක් ඇත.**
- **ගායනය සමඟ සරල චලන දැක්විය හැකිය.**
- **රිද්මයානුකූල ලක්ෂණ ඇත.**
- **හඬ පාලනය කරගනිමින් හැඟීම් උද්දීපනය වන සේ නැළවිලි කවි ගායනය කල යුතුවේ.**

## නැළවිලි කවි ගයා රස විඳිමු.

දොයි දොයි දොයි දොයියය බබා
බයි බයි බයි බයියය බබා

ලොවේ පුතුන් බොහෝ ඇතා
වඩා නැළෙව්වත් හඬතා
මගේ පුතා එහෙම නැතා
නාඬා නැළවෙන්න පුතා

නුඹෙ අම්මා කොතැන ගියේ
කිරි එරවා එන්ට ගියේ
කිරි මුට්ටිය ගෙ ගියේ
ගඟට උඩින් කොක්කු ගියේ

ඔන්න බබෝ ඇතින්නියා
ගල් අරඹේ සිටින්නියා
ගලින් ගලට පනින්නියා
බබු දැකලා දුවන්නියා

අතට වෙරළු ඇහිඳ ගෙනේ
ඉනට පලා නෙලා ගෙනෙ
බරටම දර කඩා ගෙනේ
එයි අම්මා විගස කිනේ

<u>ක්‍රියාකාරකම</u>

1. නැළවිලි කවි ගායනා කිරීමේ අරමුණ ලියන්න.
2. නැළවිලි කවි ගායනාවල සුවිශේෂී ලක්ෂණ 03ක් ලියන්න.
3. නියමිත නාද මාලාවට චලන දක්වමින් කවි ගායනා කරන්න

- **උපදේශකත්වය - එස්. එම්. ඩී. පී .සේනානායක (ස. අ .අ. නර්තන ක. අ. කා. හෝමාගම)**
- **ටී. එච්. ප්‍රියන්තා දමයන්ති මිය (බප/ හෝ/ බෝපේ රාජසිංහ මහා විද්‍යාලය)**
- **එම්. අයෝමා විමලවීර මිය (බප/ හෝ/ පාදුක්ක සිරි පියරතන ම.ම.වි.)**
- **ඩී.එස්. තරංගා දැරණියගල මිය (බප/ හෝ/ සුභාරතී මහාමාත්‍ය මහා විද්‍යාලය**